පළාත් පාලන දෙපාර්තමේන්තුව (බස්නාහිර පළාත)
உள்ளூராட்சித்திணைக்களம்(மேல் மாகாணம்)
**DEPARTMENT OF LOCAL GOVERNMENT (WESTERN PROVINCE)**

අපගේ දැක්ම :- "යහපාලනයෙන් සපිරි ඵලදායී පළාත් පාලන සේවාවක්"

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My No. LGD/2A/ පොදු | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No. | දිනය<br>திகதி<br>Date 2020.04.10 |

බස්නාහිර පළාතේ සියළුම පළාත් පාලන ආයතනවල
නාගරික කොමසාරිස්/ ලේකම්.

**<u>කොවිඩ් 19 වසංගත තත්වය යටතේ එළවළු හා පළතුරු නිෂ්පාදකයින් සහ පාරිභෝගිකයින් සඳහා සහන සැලසීම.</u>**

ශ්‍රී ලංකාව තුල ව්‍යාප්ත වෙමින් පවතින කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් විශාල වශයෙන් එළවළු හා පළතුරු හුවමාරු වන දිවයින පුරා පිහිටා ඇති ආර්ථික මධ්‍යස්ථාන වසා දැමීමට තීරණය කර ඇති බැවින් එම ප්‍රදේශවල ගොවීන්ගේ නිශ්පාදන අලෙවි කර ගැනීමට නොහැකි වීමත් හා බස්නාහිර පළාත සඳහා එම එළවලු හා පළතුරු ප්‍රමාණවත් පරිදි නොලැබීම නිසාත් එම ප්‍රදේශවල ගොවීන් හා විශේෂයෙන් බස්නාහිර පළාත තුල ජීවත්වන මහජනතාව අපහසුතාවට පත්වී ඇති බැවින් ඒ සඳහා සුදුසු වැඩපිළිවෙලක් සකස් කර කඩිනමින් ක්‍රියාත්මක කරන ලෙස අග්‍රාමාත්‍ය කාර්යාලයේ ස්ථාපිත කර ඇති අත්‍යාවශ්‍ය මහජන සේවාවන් අඛණ්ඩව සැපයීම, මෙහෙයවීම, සම්බන්ධීකරණය හා පසු විපරම පිණිස වූ ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් මා වෙත දන්වා ඇත.

02. ඒ අනුව ඔබ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුල සිටින පිට පළාත් වලින් එළවලු හා පළතුරු රැගෙන විත් වෙළදාම් කිරීමට කැමති (විශේෂයෙන් පළතුරු වෙළදාම් කරන) අයගේ තොරතුරු මේ සමඟ අමුණා ඇති ආකෘතිය පරිදි ඔබගේ නිර්දේශය සහිතව නොපමාව ඉදිරිපත් කරන ලෙස කාරුණිකව දන්වමි. (මහ නගර සභාවකින් 04, නගර සභාවකින් 03 හා ප්‍රාදේශීය සභාවකින් 04 වන පරිදි)

03. එම පුද්ගලයන් සඳහා අවශ්‍ය බලපත්‍ර අත්‍යාවශ්‍ය මහජන සේවාවන් සැපයීම පිණිස වූ ජනාධිපති කාර්ය සාධක බලකාය මැදිහත් වීමෙන් ලබා දීමට කටයුතු කරන බවද වැඩිදුරටත් දන්වමි.

කසුන් ඇප සෙනෙවිරත්න,
පළාත් පාලන කොමසාරිස්,
බස්නාහිර පළාත.

පිටපත් -

| | | |
|---|---|---|
| 01. | ප්‍රධාන මෙහෙයුම් නිලධාරි, අත්‍යාවශ්‍ය මහජන සේවාවන් අඛණ්ඩව සැපයීම, මෙහෙයවීම, සම්බන්ධීකරණය හා පසු විපරම පිණිස වූ ජනාධිපති කාර්ය සාධක බලකාය. | -කාරු.දැ.ගැස |
| 02. | ප්‍රධාන ලේකම් (බ.ප) | -කාරු.දැ.ගැස |
| 03. | ආණ්ඩුකාර ලේකම් (බ.ප) | -කාරු.දැ.ගැස |
| 04. | පළාත් පාලන ලේකම් (බ.ප) | -කාරු.දැ.ගැස |
| 05. | පළාත් පාලන සහකාර කොමසාරිස් (කොළඹ/ගම්පහ/කළුතර) | -පළාත් පාලන ආයතන සමඟ සම්බන්ධීකරණය කර අදාල තොරතුරු 2020.04.10 දිනම මා වෙත වාර්තා කිරීම සඳහා |

| ලිපිනය / முகவரி/**Address** | අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල / இல.204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுள்ள / No. 204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla |
|---|---|

| දුරකථන தொலைபேசி **Telephone** | පොදු General | කොමසාරිස් Commissioner | පාලන හා මානව සම්පත් Admin / HR | නීති Legal | සැලසුම් Planning | ගිණුම් Accounts | විමර්ශන Investigation | ආයතන පරිපාලන Establishment | ප්‍රජා සංවර්ධන Community Development |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2093156 | 2092570 | 2092574/2092576 | 2092572 | 2092571 | 2092573 | 2092580 | 2092582 | 2092583 |

| ෆැක්ස් / பெக்ஸ்/ **Fax** | 2092577 | වෙබ් ලිපිනය/ வெப்தளம்/**Web** | www.lgd.wpc.gov.lk | ඊමේල් /ஈமெயில்/ **Email** | lgd@wpc.gov.lk |
|---|---|---|---|---|---|